**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව තහවුරු කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක 1/2017 හා 2017 ජුනි 28 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වත්කම් කළමණාකරණ චක්‍රලේඛ ප්‍රකාරව රජයේ සියළුම මූල්‍ය නොවන වත්කම් 2017 ජූලි 31 දිනට පෙර ගිණුම්ගත කිරීම අනිවාර්ය කර තිබුණි.<br><br>එහෙත් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන ලද ඒසීඒ6 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.මිලියන 704.26 ක් වූවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.මිලියන 255.79 ක් විය. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් විෂයයන් 1,465 ක වටිනාකම වූ රු.මිලියන 231.74 ක් හා අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වටිනාකම රු.මිලියන 24.03 ක් වූ වත්කම් පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කිරීම ඉහත වෙනස සඳහා හේතුවී තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියළුම වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කඩිනම් පියවරගත යුතුය. | වත්කම්හි වටිනාකම් හඳුනාගන්නා ලද අයිතම පමණක් Cigass වැඩසටහනට ඇතුළත් කර තිබුණු අතර මේ වන විට සියළුම රථවාහන ගිණුම් ගත කර ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කරනු ලබන සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළයුතු වීම. | ගොඩනැගිලිවල වටිනාකම "තක්සේරු දෙපාර්තමේන්තුව" වෙත තක්සේරු කර දෙන ලෙසට ඉල්ලා සිටි නමුත්, ඒවයේ වටිනාකම් මේ දක්වා තක්සේරු කර නොමැති බැවින් එම ගොඩනැගිලි ඇතුළත් කර නොතිබුණි. 2019.07.15 දින තක්සේරු දෙපාර්තමේන්තුව මෙම කාර්යාලය වෙත පැමිණ තක්සේරු කළ අතර, වාර්තාව ලබා දීමට |

| | | | |
|---|---|---|---|
| | | | නියමිතය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට අයත් ඉඩම් තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළයුතු වීම. | 2019.07.15 දින තක්සේරු දෙපාර්තමේන්තුව මෙම කාර්යාලය වෙත පැමිණ තක්සේරු කළ අතර, වාර්තාව ලබාදීමට නියමිතය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් වලට අදාල ඒසීඒ6 ආකෘතියේ 2018 ජනවාරි 01 දිනට වත්කම්වල වටිනාකම රු.මිලියන 680.14 ක් විය. එහෙත් 2017 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.මිලියන 74.99 ත් විය. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් 2018 වර්ෂය සඳහා තක්සේරුවක් සිදුකර තිබුණේ ද යන්න පිළිබඳ තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවීය. | සමාලෝචිත වර්ෂයට අදාල ගිණුම් පිළියෙල කිරීමේ දී ආරම්භක ශේෂවලට සිදුකළ යුතු ගැලපීම් සිදුකර ගිණුම් පද්ධතිය යාවත්කාලීන කළ යුතු වීම. | පසුගිය ගිණුම් සැකසීමේදී මුදල් තත්ත්ව ප්‍රකාශනයක් පිළියෙල නොකරන ලදි. එබැවින් මෙහි වැදගත්කම 2018 වර්ෂයේදී ඇතුළත් කළ බැවින් එය නිවැරදි ලෙස ගිණුමේ පෙන්වා දීමට කටයුතු කරන ලදී. තවද Assets Inventorige System වල අඩුපාඩුකම් හේතුකොට ගෙන මෙකී වටිනාකමේ වෙනස්කම් සිදුවී තිබුණි. මෙය නිවැරදි කිරීම සඳහා පොදු-122 මගින් 2018 වර්ෂවල ක්‍රියාමාර්ග ගන්නා ලදී. (මෙය පිළිබඳව ලියවිලි විගණනයේදී ඔබ වෙත ඉදිරිපත් කොට ඇත.) එබැවින් 2018 න් පසුව වත්කම් ගිණුම නිවැරදි කරන ලදී. එහෙයින් ඉදිරියේදී මෙවැනි ගැටළු සිදුනොවන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | වර්ෂය තුල වත්කම් අපහරණයක් හෝ විනාශ කිරීමක් හෝ සිදුකර නොතිබුණ ද, මූල්‍ය ප්‍රකාශනයෙහි (ඒසීඒ6) හා රු.26,316,881 ක් වටිනා වත්කම විකුණුම් වශයෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී නියමිත ආකෘති අනුව වාර්තා කළයුතු වීම. | යම්කිසි වත්කමක් පරිගණකයට (Cigass) ඇතුළත් කිරීමේදී යම් වැරැද්දක් සිදුවුවහොත් එය නිවැරදි කිරීම සඳහා වැඩසටහන තුල අලෙවියක් හෝ විනාශ කිරීමක් ලෙස සඳහන් කිරීමට සිදුවේ. ඇත්ත වශයෙන්ම එය Cigass වැඩසටහනේ පවතින අඩුපාඩුවක් වේ. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත් නිලධාරීන් 53 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 (1) හි සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | 2019.08.08 දින පැවැති ගණකාධිකාරීවරුන්ගේ රැස්වීමේ දී නැවත උපදෙස් ලබාදී ඇති අතර, ප්‍රගතිය වාර්තා කිරීමට දන්වා ඇත. |
| **විදුලි උපකරණ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 454 (2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | |
| **බැරකම් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වගකීම් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | |
| **හානිපූර්ණ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානිපූර්ණ ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් හානිපූර්ණ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | |

## 1.6.4 අවිධිමත් ගනුදෙනු

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවූ "පුනරුත්ථාපන අධිකාරිය" විසින් 2014 වර්ෂයේ දී තිරුක්කෝවිල් ප්‍රාදේශීය බල ප්‍රදේශයේ තංගවේලායුදපුරම් හා කන්චිකුඩිආරු ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ යටතේ නිවාස ඉදිකිරීම සඳහා වූ ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීමේ දී එක් ප්‍රතිලාභියෙකුට රු.200,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ බැවින්, අදාල වගකිව යුතු නිලධාරීන් මෙම ගෙවීමේදී තම වගකීම නිවැරදිව ඉටුකර නොතිබූ බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 ප්‍රතිපාදන අනුව මෙන්ම කළමනාකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ද කටයුතු කළ යුතුය. | එන්.මහේෂ්වරන් නමැති ප්‍රතිලාභියාට නිවසක් ඉදිකිරීම සඳහා අදියර 03කින් රු.200,000 තිරුක්කෝවිල් මහජන බැංකු ගිණුම වෙත මුදල් නිදහස් කර ඇත. පසුව ඉහත ව්‍යාපෘතීන්හි සැපයුම්කරුවකු වශයෙන් මොහු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම මත සේවා ලබා දීම වෙනුවෙන් නැවත රු.200,000 ක් ගෙවා ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 සහ 2018 වර්ෂයන්හිදී වැට් බදු සඳහා සහ රැඳවුම් බදු සඳහා අයකර ගන්නා ලද රු.2,108,443 ක මුදල තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණද, එම මුදල සම්බන්ධයෙන් මේ වන තුරුද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කිසියම් ගනුදෙනුවක් වෙනුවෙන් රැස්කරගන්නා ලද වැට් බදු හා රැඳවුම් බදු සම්බන්ධයෙන් අදාල පනත් වල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | 2017 සහ 2018 වර්ෂවල තැන්පතු ගිණුමේ පෙන්වා දී ඇති VAT බදු මුදල අදාළ දේශීය ආදායම් බදු අවසරපත්‍රය ඉදිරිපත් නොකළ බැවින්, රැදවුම් මුදල් අව්ච්ඡේද වැඩ සඳහා රැදවුම් මුදලක් ලෙස තැන්පතු ගිණුමේ රඳවා ඇත. අදාළ අවසර පත්‍රය ලබා නොදුනහොත් මෙම මුදල රාජ්‍ය ආදායමට ගන්නා බව වාචිකව මෙන්ම ලිඛිතවද කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "දැයට කිරුළ 2013" සංවර්ධන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් අත්සන් කරන ලද<br>i. තිඹිරිගොල්ල පන්නල්ගම පාර පස් පුරවා සකස් කිරීම හා ගල උඩ කොටස කොන්ක්‍රීට් කිරීම.<br>ii. පන්නල්ගම 1 සී ක්‍රීඩා පිටිය සකස් කිරීම<br>iii. දමන බක්මීටියාව මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම සහ පස් පිරවීම (4km කණුව අසළ)<br>iv. පන්නල්ගම බක්මීටියාව මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම, පස් පිරවීම සහ පාලම ඉදිකිරීම<br>v. බක්මීටියාව මාර්ගයේ දඹ ගස අසල ඇති පැති බැම්ම ඉදිකිරීම හා පස් පිරවීම.<br>යන ව්‍යාපෘති 05 ක්‍රියාත්මක කිරීමේදී රු.6,512,909 ක මුදලක් අවභාවිත කර තිබූ බව නිරීක්ෂණය විය. | සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සපයා ඇති ප්‍රතිපාදන අපේක්ෂිත ප්‍රතිලාභ උපරිමයෙන් ප්‍රදේශයේ ජනතාවට ලබාදීමට හැකිවන පරිදි යෙදවිය යුතුවීම. | මෙම ව්‍යාපෘති සඳහා ගෙවීම් සිදුකිරීම දමන ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීගේ වාර්තා මත දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එවකට සිටි නිලධාරීන් විසින් වරින් වර සිදුකර ඇත. එසේ වුවද, ව්‍යාපෘති නිම කිරීම සම්බන්ධව ගැටලු සහගත තත්ත්වයක් වාර්තා වීමෙන් අනතුරුව කරුණු සොයා බැලීම සිදුකරන ලදී. ඒ සඳහා මෙම කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයා වාර්තා ලබා ගන්නා ලදි. එම වාර්තා මීන් පෙර ඔබ වෙත ඉදිරිපත් කර ඇත. එසේම පොලිස් විශේෂ අපරාධ විමර්ශන අංශය මගින් මේ සම්බන්ධව විශේෂ විමර්ශනයක් සිදුකරන අතර, වැඩිදුර විමර්ෂන කටයුතු සඳහා අදාල ලිපිගොනු ඔවුන් භාරයට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන අංශය විසින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා සුළු පරිමාණ ඇඟළුම් | සියළු වත්කම්වලින් අපේක්ෂිත උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි උපයෝජනය කළ යුතු වීම. | අදාළ අමාත්‍යාංශ නිසි උපදෙස් නොලැබීම හේතුවෙන් මෙකී තත්ත්වය උදාවී තිබුණි. කුඩා ඇඟළුම් කම්හල් යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශය විසින් |

| | | |
|---|---|---|
| කර්මාන්ත පිහිටුවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සඳහා ලබා දී තිබුණු රු.19,525,600 ක් වටිනා මහන මැෂින් හා උපකරණ 2019 පෙබරවාරි 11 වන දින වන විටත් නිෂ්කාර්යව පැවතුණ | | උපදෙස් මාලාවක් ලබා දී තිබුණ ද ප්‍රතිලාභීන් විසින් එම සමිති හා එක්ව කටයුතු කිරීමට අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු මතුවිය. |

**3.3 පාඩු හා හානි**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අලාභ හා හානි වාර්තාව යටතේ කිසිවක් නොමැති බව වාර්තා කර තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක EP-PD-2681 දරන වාහනයට සිදුවී තිබූ අනතුරට අදාලව රු.122,364 ක අලාභයක් පැවති බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන වාර්තාවල දිස්ත්‍රික් ලේකම් කාර්යලයට අදාල නිවැරදි තොරතුරු වාර්තා කළ යුතුවීම. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ F/DA/07/WR115/002 අංක හා 2019.07.10 දිනැති ලිපිය පරිදි පාඩුව පොතෙන් කපාහැරීමට කටයුතු කර ඇත. |